යම් ජන කොටසක ආකල්ප සහ චින්තනය හැඩගැස්වීම කෙරෙහි ඔවුන් භාවිතා කරනා භාෂාවෙන්ද බලපෑමක් සිදුවන බව අපට පිළිගැනීමට සිදුවේ. වෙනත් ලෙසකින් පවසන්නේ නම්, ශිෂ්ට සම්පන්න භාෂාවක් භාවිතා කිරීම ඔස්සේ වඩාත් ශිෂ්ට සම්පන්න චින්තනයක් දියුණු කිරීමටද හැකියාව ලැබෙනු ඇත. මාධ්‍ය මගින් සන්නිවේදනය කරනු ලබන භාෂාවද එහිලා සැලකිය යුතු දායකත්වයක් ලබාදේ. මාධ්‍ය මගින් වඩාත් ශිෂ්ට සම්පන්න භාෂාවක් භාවිතයට ගත යුතු යැයි අප පවසන්නේ එහෙයිනි.

එයට එක් උදාහරණයක් ලෙසින්, දූෂණය හෝ කෙළෙසීම වැනි යෙදුම් වල භාවිතය ගත හැක. දූෂණය හෝ කෙළෙසීම යන්නෙන්, ඊට පාත්‍ර වූ වින්දිතයා අපවිත්‍ර වී ඇති බවක්, කිලිටි වී ඇති බවක් ගම්‍ය වේ. එසේම එම යෙදුම් හා බැඳි සමාජ ආකල්පයද වින්දිතයාව කොන් කරනා සුළු නොවන්නේදැයි අපට ප්‍රශ්න කිරීමට සිදුවේ. එම නිසා, දූෂණය හෝ කෙළෙසීම වැනි යෙදුම් වෙනුවට ලිංගික අපරාධය හෝ බාලවයස්කරුවෙකු සම්බන්ධයෙන් නම් ලිංගික අපයෝජනය වැනි යෙදුම් භාවිතය වඩාත් යෝග්‍ය වනු ඇත. ඒ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #SinhalaPress #SathiAgaAruna**